**ශීර්ෂය :- 417 - වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

\------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

\--------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

. (අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීම්වල වටිනාකම රු. 19,508,026 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනයේ මිලදී ගැනීම් ලෙස දක්වා තිබූ වටිනාකම රු. 4,012,887 ක් වූ හෙයින් රු. 15,495,139 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන වල වත්කම් අත්පත් කරගැනීම් ලෙස දක්වා ඇති වටිනාකම වන රු. 4,012,887 යනු වත්කම් අත්පත් කර ගැනීමේ වැය විෂයක් වන 2102 හා 2103 න් කරන ලද මිලදී ගැනීම් වේ.<br>මීට අමතරව වෙනත් වැය විෂයන් මඟින්ද වියදම් දරා ඇති නමුත් එය මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් නොවීමට හේතුව වන්නේ වෙනත් වැය විෂයන් මඟින් කරන ලද වත්කම් අත්පත් කර ගැනීමේ සිගාස් පරිගණක වැඩසටහන තුළ ඉන්වෙන්ට්‍රි ගත කිරීමට පහසුකම් නොමැති බැවිනි. | තොරතුරු නිවැරදිව මූල්‍ය ප්‍රකාශන තුලට ඇතුලත් කල යුතුය. |

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් තුල ඇතුලත් පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් ගෙවීම් ශේෂයට ඇතුලත් විය යුතු 2001,2002,2003 හා 2401 වැය විෂයන්ට අදාල වියදම වූ රු. 11,667,144 ක වටිනාකමක් ආයෝජන ක්‍රියාකාරකම් තුල ඇතුලත් භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදීගැනීම් හා වෙනත් ආයෝජන අත්පත්කර ගැනීම් තුල දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 2021 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධව පවත්වනු ලැබූ සම්මන්ත්‍රණයේදී දෙනු ලැබූ උපදෙස් වලට අනුකූලව හා ඔවුන් විසින් එම දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරමින් දෙනු ලැබූ ආදර්ශ අකෘතියට අදාලව මෙම වැය ශීර්ෂවල වටිනාකම භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් යටතේ දක්වා ඇත. | තොරතුරු නිවැරදිව මූල්‍ය ප්‍රකාශන තුලට ඇතුලත් කල යුතුය. |

### 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කර නොතිබුණි. | විගණන විමසුමේ ඇතුළත් වූ අලාභ හානි සම්බන්ධයෙන් ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | රෙගුලාසිය ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 1645(අ) හා 1647(අ) ප්‍රකාර වාහන ලොග් පොත් පවත්වා නොතිබුණි. | මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වෑන් රථ 01ක්, ඩබල් කැබ් රථ 02ක් හා කාර් රථයක් ලබා ගෙන ඇත. එහෙත් ඔබ වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු වාර්තාවේ එම වාහන 04 පිළිබඳව තොරතුරු ප්‍රමාද දෝෂයකින් සටහන් කර නොමැත.<br>මෙම වාහන 04 මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබා ගෙන ඇති බැවින් අමාත්‍යාංශය මගින් ලොග් පොත් පවත්වා ගෙන යාමක් සිදු නොවන බව කාරුණිකව දන්වමි. | රෙගුලාසිය ප්‍රකාරව වාහන ලොග් පොත් සෑම වාහනයක් සම්බන්ධයෙන්ම යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |

**1.6.4. විගණන සාක්ෂි නොවීම**

---------------------------

| නිරීක්ෂණය | අමාත්‍යාංශයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නව ජීවන වතු නිවාස වැඩසටහන පිළිබඳව 2009 වර්ෂයට අදාළ මාර්ගෝපදේශයේ අංක 7.2 යටතේ ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී වැවිලි මානව සංවර්ධන භාරයේ හා වතු නිවාස සමූපකාර සමිතියේ සහභාගිත්වයෙන් යුතු කමිටුවක් මඟින් නිර්ණායක 07 ක් මත පදනම්ව සිදුකල යුතු වුවත් ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී එවැනි කමිටුවක් පත් කිරිමට කටයුතු කර නොතිබුණි. ප්‍රතිලාභීන් විසින් ගෞරවිල නිවාස A හා B ව්‍යාපෘතියේ සහ කෙග්ලියා වතුයායේ නිවාස ව්‍යාපෘතිය සඳහා අයදුම්පත් යොමු කොට ඉල්ලීම් සිදුකල බවටත් ඔවුන් තෝරාගැනීමේදී නිවැරදි ක්‍රමවේදයන් අනුගමනය කල බවටත් සාධාරණ තහවුරුවක් ලබාගත හැකි පරිදි තොරතුරු ද නොවුණි. අමාත්‍යාංශය විසින් ප්‍රතිලාභීන් තෝරා ගැනීම නිවැරදිව සිදුවන බවට අධීක්ෂණය කරද හෝ නොතිබුණි. ඒ සම්බන්ධව ප්‍රතිලාභීන්ගේ ලැයිස්තු හැර වෙනත් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. | එකඟ වෙමි. නිවාස ව්‍යාපෘතීන් සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රමවේදයන් අනුගමනය කළ බවට ලිඛිත සාක්ෂි අදාළ විෂය නිලධාරීන් විසින් ගොනුගත කර නොමැති බව නිරීක්ෂණය විය. මේ පිළිබඳව තොරතුරු විමසා වැවිලි මානව සංවර්ධන භාරය වෙත ලිපියක් යොමු කළ අතර, අදාළ තොරතුරු ලද පසු ඔබ වෙත දැන්වීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. ඉදිරියේදී ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා අමාත්‍යාංශය සෘජුව මැදිහත් වන බව දැනුම් දෙමි. | විගණනයට අවශ්‍ය තොරතුරු කඩිනමින් ඉදිරිපත් කිරීම කල යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 වියදම් කළමනාකරණය

-----------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු. 600,000 ක පුනරාවර්තන වැය විෂයන් දෙකක ප්‍රතිපාදනයන් ද, රු. 3,200,000 ක මූලධන වැය විෂයන් දෙකක ප්‍රතිපාදනයන් ද රු. 199,000,000 ක උප ව්‍යාපෘතියක් වෙනුවෙන් වෙන් කර තිබූ ප්‍රතිපාදනයන් ද සමාලෝචිත වර්ෂය තුලදී කිසිදු වියදමක් නොදැරීම නිසා මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | දේශීය හා විදේශීය ගමන් සීමා වීම, වර්ෂය අවසන් වීමට පෙර අදාල අනුමැතීන් ලබා ගැනීමට නොහැකි වීම,කොවිඩ් තත්ත්වය හේතුවෙන් නිවසේ සිට වැඩ කිරීම, නව බඳවාගැනීම් අත්හිටුවීම සහ මුදල් අමාත්‍යාංශයෙන් ලද උපදෙස් අනුව නව ප්‍රාග්ධන මිලදී ගැනීම් සිදු නොකිරීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | අදාල ඇස්තමේන්තු හැකිතාක් නිවැරදි අයුරින් පිළියෙල කල යුතුය. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බැරකම් ලේඛනය තුල ඇතුලත්ව තිබූ රු. 26,306,758.40 ක බැරකම්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය (සටහන iii) තුල ඇතුලත්ව නොතිබුණි. | බැරකම් ලේඛනය තුළ ඇතැම් බැරකම් දෙවරක් සටහන් වී තිබූ අතර ඇතැම් බැරකම් ගෙවීම් වැරදියට ඇතුළත් වූ ඒවා වේ. එම අගයන් ඉවත් කර මූල්‍ය ප්‍රකාශන තුළ අන්තර්ගත කර ඇති අතර ඉදිරියේදී එවැනි අඩුපාඩු සිදු නොවන ලෙස කටයුතු කිරීමට සටහන් කරගතිමි. | සමාලෝචිත වර්ෂයට අදාල සියළු බැරකම් , බැරකම් පිළිබඳ ප්‍රකාශයට නිවැරදි ලෙස ඇතුලත් කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ බැරකම් ලේඛනයට හා මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය (සටහන iii) තුලට ඇතුලත් කර නොතිබූ රු.5,895,188 ක බැරකම්, 2022 වර්ෂය තුලදී තුලදී ගෙවා තිබුණි. | බැරකම් පිළිබඳ ප්‍රකාශය පිළියෙල කිරීමේදී දෙසැම්බර් 31 දිනට සිගාස් පරිගණක වැඩසටහනට ඇතුළත් කළ හැක්කේ පවතින ප්‍රතිපාදන සීමාව තුළ පමණක් වන නමුත් දෙසැම්බර් 31 දිනට එම ප්‍රමාණය ඉක්මවා වවුචර්පත් පවතී. එම ප්‍රමාණය ඊළඟ වර්ෂයේදී මු.රෙ 115 යටතේ ලබාගන්නා අනුමැතිය මත ගෙවීම් කරන බැවින් මෙම තත්ත්වය පැන නගී. | සමාලෝචිත වර්ෂයට අදාල සියළු බැරකම් , බැරකම් පිළිබඳ ප්‍රකාශයට නිවැරදි ලෙස ඇතුලත් කල යුතුය. |

-එම-

| | | | |
|---|---|---|---|
| (ඈ) | අදාල වැය විෂයන් වල ඉතිරිවීම් සම්බන්ධයෙන් සොයා බැලීමකින් තොරව වැය විෂයන් දාහතරක් සඳහා ප්‍රතිපාදන ඉක්මවා රු. 4,367,281 ක බැරකම් සඳහා බැඳීම ඇතිකරගෙන තිබුණි. | | ප්‍රවර්තන වර්ෂයට අදාල බැරකම් සම්බන්ධයෙන් බැඳීම් ඇතිකර ගැනීමේදී අදාල වැය විෂයන් වල ඉතිරිවීම් සම්බන්ධයෙන් සැලකිලිමත්ව කටයුතු කල යුතු වේ. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

--------------------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ ලේකම් වෙත 2021 ජනවාරි 26 දින රු. 50,000 ක අත්තිකාරමක් නිකුත් කර තිබූ නමුත් අදාල අත්තිකාරම් මුදල 2021 ඔක්තෝබර් 22 දින පියවා තිබීම හේතුවෙන් දින 268 ක් ප්‍රමාද වී අත්තිකාරම් පියවා තිබුණි. | මෙම තත්ත්වයන් මේ වන විට නිවැරදි කර ඇති අතර මෙම වර්ෂය තුළ හා ඉදිරියට සිදු නොවන බවට වග බලා ගනිමි. | මු.රෙ.371 (ආ) ප්‍රකාරව කටයුතු කර යුතුයි. |
| (ආ) | එක් නිලධාරියෙකුට 2021 ජූනි14 දින 25,000 ක අත්තිකාරමක් නිකුත් කර තිබූ නමුත් අදාල අත්තිකාරම් මුදල 2021 ඔක්තෝබර් 12 දින පියවා තිබීම හේතුවෙන් දින 119 ක් ප්‍රමාද වී අත්තිකාරම් මුදල පියවා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | නිලධාරිනියකට සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම වෙනුවෙන් 2021 මාර්තු 08 දින රු. 100,000 ක අත්තිකාරමක් නිකුත් කර තිබූ අතර අදාල අත්තිකාරම් මුදල 2021 නොවැම්බර් 15 දින පියවා තිබීම හේතුවෙන් දින 251 ක් ප්‍රමාද වී අත්තිකාරම් මුදල පියවා තිබුණි. අත්තිකාරම් නිකුත් කර පියවා නොතිබූ අවස්ථාවකදී තවත් සම්මුඛ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 75,000 ක අත්තිකාරමක් 2021 මාර්තු 17 දින නිකුත්කර තිබූ බවත් එම අත්තිකාරම් මුදලද 2021 නොවැම්බර් 15 දින දක්වාම පියවීමට කටයුතු නොකිරීම හේතුවෙන් දින 243 ක කාලයක් අත්තිකාරම් ප්‍රමාද වී පියවා තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | වැවිලි මානව සංවර්ධන භාරයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2021 නොවැම්බර් 01 දින රු. 300,000 ක අත්තිකාරමක් නිකුත් කර තිබූ අතර එම අත්තිකාරම පියවීමටත් ප්‍රථම 2021 නොවැම්බර් 01 දින රු.122,463 ක අත්තිකාරමක් නැවතත් නිකුත් කර තිබුණි. තවද මෙම වැවිලි මානව සංවර්ධන භාරය ඇපයෙන් | මෙම ආයතනය අප අමාත්‍යාංශය යටතේ ගැසට් කර ඇති බැවින් ඉන්දියානු නිවාස ව්‍යාපෘතියට අදාල වැඩසටහන් සඳහා අත්තිකාරකමක් ලබාදී ඇත. | -එම- |

සීමිත සමාගමක් ලෙස ක්‍රියාත්මක වන හෙයින් අමාත්‍යාංශයෙන් පරිබාහිර ආයතනයක නිලධාරීන් වෙත අත්තිකාරම් මුදල් නිදහස් කිරීම ප්‍රශ්නගත කරුණක් විය.

**2.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවයෙන් ඉවත් වූ සේවකයින් තිදෙනෙකුගෙන් ලැබිය යුතු, වසර 1 සිට 4 දක්වා කාලයක සිට පැවත එන රු. 447,908 ක් වූ හිඟ ණය ශේෂය එම සේවකයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කේ තුරෙයිසාමි මහතාගේ හිඟ ආපදා ණය ශේෂය වූ රු.123,376, 2022.04.04 ගෙවා අවසන් කර ඇත. කේ.විජයරාජ් මහතා ඔහුගේ ඉතිරි වී ඇති හිඟ ආපදා ණය ශේෂය වූ රු.201,436 මාසිකව ගෙවීමට කටයුතු යොදා ඇත. | අදාල අයකර ගත යුතු ණය ශේෂ කඩිනමින් අයකර ගැනීම කල යුතුය. |

**2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | | **අනුකූල නොවීම** | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (3) | 6000-0-0-16-0-82 අංක දරණ තැන්පතු ගිණුමේ දක්වා ඇති රු.80,554,639 ක වටිනාකම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අවස්ථා 23 ක් 2022.04 වන විට රජයේ ආදායමට බැර කර ඇති අතර රු.9,267,738ක් අදාල පාර්ශව වෙත ගෙවීම සඳහා කටයුතු සූදානම් කර ඇත.<br>ඉතිරි මුදල වන රු.65,780,544 පොදු තැන්පත් ගිණුමෙන් ඉවත්කිරීම සඳහා නොපමාව කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 702 | වැවිලි මානව සංවර්ධන භාරයට (පීඑච්ඩීටී) ඉදිකිරීම් කොන්ත්‍රාත්තු ලබා දීමේදී අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි අනුගමනය කර නොතිබුණි. | එකඟ වෙමි.<br>2020.08.09 දිනැති අංක 2187/27 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව වැවිලි මානව සංවර්ධන භාරය, අමාත්‍යාංශය යටතේ වන ආයතනයක් ලෙස ගැසට් කර ඇති අතර, ඒ අනුව අමාත්‍යාංශය විසින් ගිවිසුම් අත්සන් කිරීමෙන් තොරව වැවිලි මානව සංවර්ධන භාරය වෙත වැඩ ඇණවුම් ලබා දෙන බව කාරුණිකව දන්වමි.<br>ඉදිරියේදී මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නියමිතය. | -එම- |
| (ඇ) | මුදල් රෙගුලාසි 702(3) | අමාත්‍යාංශය විසින් අත්සන් කරන ලද සියලුම කොන්ත්‍රාත්තු වල පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | | -එම- |
| (ඈ) | අංක 2/2018 හා 2018 අගෝස්තු 18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 වන ඡේදය හා 6 ඡේදය | චක්‍රිය අරමුදල ඇතුළු අරමුදල් 13 ක් වසා දැමීමටත් චක්‍රීය අරමුදලට අයවිය යුතු ණය රු.3,480,000 අයකර ගැනීමටත් 2021 දෙසැම්බර් 31 දක්වාම කටයුතු සිදු කර නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2/2018 අනුව මේ වන විට චක්‍රීය අරමුදල වසා දැමීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බව කාරුණිකව දන්වමි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඉ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශය 8.12.1 (අ), (ආ) සහ (ඇ) | වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද නිවාස යෝජනා ක්‍රමයේ කොන්ත්‍රාත් අධීක්ෂණයට අමතරව කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සහ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම වැවිලි මානව සංවර්ධන භාරය (PHDT) සිදු කර ඇති බව නිරීක්ෂණය විය | එකඟ වෙමි.<br>2020.08.09 දිනැති, අංක 2187/27 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව වැවිලි මානව සංවර්ධන භාරය අමාත්‍යාංශය යටතේ වන ආයතනයක් ලෙස ගැසට් කර ඇති අතර, ඒ අනුව අමාත්‍යාංශයිය සංවර්ධන වැඩසටහන්වලට අදාළ ඉදිකිරීම් කොන්ත්‍රාත් වැවිලි මානව සංවර්ධන භාරය වෙත ලබා දීම සිදු කරනු ලැබේ. ඒ අනුව ව්‍යාපෘතීන්හි අදියරයන්හි වැඩ නිමි වටිනාකම අනුව බිල්පත් ඉදිරිපත් වූ පසු ඉංජිනේරු අංශයේ නිර්දේශ මත වැවිලි මානව සංවර්ධන භාරය වෙත ගෙවීම් සිදු කරනු ලබන බව කාරුණිකව දන්වමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නව ජීවන නිවාස වැඩසටහනෙහි පෙර වර්ෂයේ සිට පැවත එන නිවාස 1010ක කටයුතු සම්පූර්ණ කිරීම යන කාර්යය ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් කර ඒ සඳහා රු.මි 158ක් වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ එම නිවාස අතුරින් කිසිදු ඉදිකිරීමක් සිදුවී නොතිබුණි. | එකඟ වෙමි.<br>2015-2019 වර්ෂයන්හි දී වැඩ ආරම්භ කරන ලද අවිච්ඡේද ව්‍යාපෘති සඳහා අතිරේක ප්‍රතිපාදන ලැබෙන තෙක් උක්ත ව්‍යාපෘතිවල ගෙවීම් කටයුතු අත්හිටුවීම හේතුවෙන් මෙම ව්‍යාපෘති අවසන් කිරීමට අපොහොසත් වී ඇති බව කාරුණිකව වාර්තා කරමි. | ක්‍රියාකාරී සැලැස්ම තුලට ඇතුලත් කරනු ලබන කාර්යයන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) වතු ප්‍රජාව ආශ්‍රිතව ප්‍රජා නායකත්වය හා ප්‍රජා සහභාගීත්වය වර්ධනය සඳහා ප්‍රමුඛ වන ජන මූල මණ්ඩල හා ජන මූල මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ග්‍රාමීය ප්‍රදේශවල ජීවනෝපාය සංවර්ධන වැඩසටහනෙහි 3.2 ව්‍යාපෘතිය යටතේ මධ්‍යස්ථාන 25 ක් පිහිටුවීම සඳහා රු.500,000ක මුදලක් වෙන් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ කිසිදු භෞතික ප්‍රගතියක් ලබා නොතිබුණි. | අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් වශයෙන් හඳුනාගෙන තිබූ මෙම මධ්‍යස්ථාන පිහිටුවීම සම්බන්ධයෙන් කටයුතු නොකරන ලද බැවින් ක්‍රියාකාරී සැළැස්ම සකස් කිරීමේදී එම කාර්යය අවසන් කාර්තුවට ඇතුළත් කරන ලදී.<br>ජන මූල ජන මණ්ඩල පිහිටුවීම දීර්ඝ කාලීන වැඩ පිළිවෙලක් බැවින් ආරම්භ කළ වර්ෂය තුල එහි භෞතික ප්‍රගතිය 5%ක් ලෙස සඳහන් විය යුතු වන අතර ප්‍රමාද දෝෂයකින් භෞතික ප්‍රගතිය ඇතුළත් කර නොමැත. මූල්‍ය ප්‍රගතිය පමණක් ඇතුළත් කර ඇත. | -එම- |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික කාර්යයසාධන වාර්තාව අනුව වැඩසටහන් 03 ක් යටතේ ව්‍යාපෘති 11ක් ක්‍රියාත්මක වූ අතර ව්‍යාපෘති 10 ක භෞතික ප්‍රගතිය සියයට 1.7 සිට සියයට 69 අතර වී තිබුණි. | අදහස් දැක්වා නැත | ක්‍රියාකාරී සැලැස්ම තුලට ඇතුලත් කරනු ලබන කාර්යයන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කාර්යසාධන වාර්තාවෙහි පසුගාමී ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ව්‍යාපෘති 08 ක් සඳහා රු.මිලියන 558.24ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර තත්‍ය වියදම රු.මිලියන 295.12 ක් වුවද ව්‍යාපෘති 05 ක භෞතික ප්‍රගතිය සියයට 6.8 සිට සියයට 83ක මට්ටමක පැවතුණි. | යටිතල පහසුකම් වැඩසටහන් එක් එක් ව්‍යාපෘති කාර්යයන්ට අදාල මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කාර්යසාධන වාර්තාව තුල ඇතුළත් කර නොමැති වීම. අතපසුවීමක් බව හඳුනාගෙන ඇත. ඒ අනුව පාර්ලිමේන්තු සභාගත කිරීමට නියමිත 2021 කාර්යසාධන වාර්තාවෙහි එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | -එම- |
| (ඇ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව ජීවනෝපාය සංවර්ධන වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 100 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබුණද තත්‍ය වියදම රු.මිලියන 62.42 ක් විය. එහෙත් උප ව්‍යාපෘති සඳහා ස්ථාපිත ඉලක්ක ළඟාකරගැනීමේ භෞතික ප්‍රගතිය ශුන්‍ය මට්ටමේ සිට සියයට 89 දක්වා වූ මට්ටමක පැවතුණි. තවද ප්‍රජා දැනුවත් කිරීමේ හා ධාරිතා උපයෝජන ව්‍යාපෘතිය යටතේ කලාප 7හිම අවශ්‍යතා හඳුනාගැනීමේ සමීක්ෂණ පැවැත්වීම ඉලක්ක කර තිබුණද ප්‍රගති වාර්තා අනුව එවැනි කාර්යයක් ඉටුකර නොතිබුණි. | ප්‍රජා දැනුවත් කිරීමේ හා ධාරිතා උපයෝජන ව්‍යාපෘති යටතේ ක්‍රියාකාරී සැලැස්මේ 3.1 හා 3.2 දක්වා ඇති පරිදි අමාත්‍යාංශය විසින් කලාප 7හි ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර ඇති PCCF (වැව්ලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා) නිලධාරීන් මඟින් ඒ ප්‍රදේශ වල වැව්ලි ප්‍රජාවගේ අවශ්‍යතා පිළිබඳ සමීක්ෂණ වාර්තා ලබාගැනීමට කටයුතු කර ඇත. | -එම- |

**3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයේදී නිවාස ඒකක 742ක් වතු ප්‍රජාව වෙත ප්‍රදානය කිරීමේ ඉලක්කය සහිතව කටයුතු කළද වර්ෂය අවසාන වන විට නිවාස ඒකක 19ක් පමණක් සම්පූර්ණ කර තිබූ අතර කිසිදු නිවාසයක් ජනතාව වෙත ප්‍රදානය කර නොතිබුණි.තවද මෙම ව්‍යාපෘතිය යටතේ නිවාස 350න් 283ක වැඩ කටයුතු, එනම් අපේක්ෂිත ඉලක්කයෙන් සියයට | එකඟ වෙමි.<br>වතු සමාගම්වලින් ඉඩම් නිදහස් කර ගැනීම සහ NBRO වාර්තා ලබා ගැනීම හා අදාළ වැව්ලි සමාගම් විසින් ඉඩම් එළි පෙහෙළි කිරීමෙන් අනතුරුව නිවාස ඉදි කිරීම ආරම්භ වේ. එම කාලය තුළ රටේ පැවැති අධික කොරෝනා වසංගත තත්වය ද හේතුවෙන් ද වර්ෂය තුළ සිදු වූ ගොඩනැගිලි අමුද්‍රව්‍ය මිල ඉතා සීඝ්‍රයෙන් ඉහළ යාම හා අමුද්‍රව්‍ය හිඟය හේතුවෙන් ද ව්‍යාපෘතීන්හි ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීමෙන් ව්‍යාපෘති අවසන් කිරීමට අපොහොසත් වී ඇති බව වාර්තා කරමි. | අදාල ව්‍යාපෘතීන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 81ක් පමණ වර්ෂය අවසාන වන විටත් ආරම්භ කර නොතිබුණි. | මේ වන විට ආදාළ ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතින බවත් කාරුණිකව වාර්තා කරමි. | |
| (ආ) | අමාත්‍යාංශය විසින් වාර්ෂිකව ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩසටහන් තුළින් වතු ප්‍රජාවගේ ගැටළු නිරාකරණය වීමේ ප්‍රගතිය පිළිබඳ පරීක්ෂා කිරිමේදී සමාලෝචිත වර්ෂය අවසාන වන විට විධිමත් සනීපාරක්ෂක පහසුකම් නොමැති පවුල් සංඛ්‍යාව කලාප 7හි මුළු පවුල් සංඛ්‍යාවෙන් සියයට 19.7ක් පමණ වී තිබුණි. | එකඟ වෙමි. අමාත්‍යාංශයට ලැබෙන සීමිත ප්‍රතිපාදන මත පදනම්ව සනීපාරක්ෂක පහසුකම් සැපයීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන බව කාරුණිකව වාර්තා කරමි. | -එම- |

**3.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

**------------------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| හරිත රන් නිවාස ව්‍යාපෘතිය යටතේ 2016,2017 හා 2018 වර්ෂවල අවිච්ඡේදව පැවති නිවාස ඒකක 1026 ක ඉදිකිරීම් කටයුතු 2020 වර්ෂයේදී අත්හිටුවා තිබුණි. නිවාස ඒකක 482ක් වෙනුවෙන් වැඩ ආරම්භකිරීමේ පිරිවැය රු.67,120,000 ක් ගෙවීම් කර තිබූ අතර අංක SMEHCI/05/14/GA/2021/09 හා 2022 මාර්තු 31 දිනැති ලිපිය අනුව මෙම මුදල් අයකරගෙන ඇති බව දක්වා තිබුණද ඒ පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. තවද අවිච්ඡේදව පවතින නිවාස ව්‍යාපෘතින්හි භෞතික ප්‍රගතියක් ළඟාකරගැනීමෙන් තොරව නව ව්‍යාපෘති ආරම්භකිරීම නිසා රජයේ අරමුදල් කාර්යක්ෂම ලෙස උපයෝජනය කර නොතිබුණි. | ඉදිකිරීම් අත්හිටුවන ලද ව්‍යාපෘති සඳහා ගෙවන ලද මුදලින් රු.58,580,000.00ක මුදලක් නව ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු මුදල් වෙනුවෙන් ආවරණය කර ගෙන ඇති අතර ඉතිරි මුදල වන රු.8,540,000.00 අයකරගැනීම් සඳහා ලේඛන සකස් කර ඇත. | අදාල ව්‍යාපෘතීන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුය. |

**3.5 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

**-----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේදී ආරම්භ කරන ලද සාමුහික ගොවිපලවල් ඉදිකිරීමේ ව්‍යාපෘති 02ක් 2021 මාර්තු 04 දින වන විට නිම කළයුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඇස්තමේන්තුගත මුදලින් රු.7,675,704ක් වැය කර සියයට 61ක මූල්‍ය ප්‍රගතියක් පමණක් ලගාකරගෙන තිබුණි. | ඩයගම පොලිතින් ආශ්‍රිත වගා ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු මේ වන විට සම්පූර්ණ කර ඇති අතර ප්‍රතිලාභීන් විසින් ව්‍යාපෘතිය උපයෝජනය කරමින් පවතින බව කාරුණිකව වාර්තා කරමි. අනෙක් ව්‍යාපෘතිය වන, වටගොඩ පොලිතින් ආශ්‍රිත වගා ව්‍යාපෘතිය 2021 නොවැම්බර් 23 සිට අත්හිටුවන බව STMF ආයතනය විසින් (සෞම්‍යමූර්ති තොණ්ඩමාණ් අනුස්මරණ පදනම) ව්‍යාපෘති සමාගම වෙත 2021 නොවැම්බර් 23 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බව බව කාරුණිකව වාර්තා කරමි. | ව්‍යාපෘතීන් අදාල කාලසීමාව තුල උපරිම කාර්යක්ෂමතාවය කින් යුතුව සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ කලාප 06ක ඉදිකිරීම් සම්පූර්ණ කළ යුතු ව්‍යාපෘති 15ක ඉදිකිරීම් කටයුතු වර්ෂය අවසාන වන විටත් නිම නොකර ඇස්තමේන්තුගත මුදලින් රු.169,091,715ක් පමණක් වැයකර තිබුණි. | එකඟ වෙමි. වතු සමාගම්වලින් ඉඩම් නිදහස් කර ගැනීමට සහ NBRO වාර්තා ලබා ගැනීමට රටේ පැවැති අධික කොරෝනා වසංගත තත්වය ද හේතුවෙන් අපහසු වී තිබුණි. එම නිසා මූලික කටයුතු අපේක්ෂිත ලෙස ඉටු කර ගැනීමට බාධාකාරී විය. එසේම වර්ෂය තුළ සිදු වූ ගොඩනැගිලි අමුද්‍රව්‍ය මිල ඉතා සීඝ්‍රයෙන් ඉහළ යාම හා අමුද්‍රව්‍ය හිඟය හේතුවෙන් ව්‍යාපෘතීන්හි ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීමෙන් ව්‍යාපෘති අවසන් කිරීමට අපොහොසත් වී ඇති බව කාරුණිකව වාර්තා කරමි. | ව්‍යාපෘතීන් අදාල කාලසීමාව තුල උපරිම කාර්යක්ෂමතාවය කින් යුතුව සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුය . |

## 3.6 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගාල්ල,හැටන් හා නුවරඑළිය කලාප 03හි වතු 08ක නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු ගත මුදල වූ රු.215,605,000ක් වූ මුදලින් රු.40,300,000ක් එනම් සියයට 18.69ක් වැය කර තිබුණද ඉඩම් නිදහස් කර ගැනීමේ ගැටළු හේතුවෙන් කිසිදු භෞතික ප්‍රගතියක් ලබා නොතිබුණි. | එකඟ වෙමි.<br>මෙම නිවාස ව්‍යාපෘතීන්හි ඉදිකිරීම් කටයුතු මේ වන විට සිදුවෙමින් පවතින බව කාරුණිකව වාර්තා කරමි. | ව්‍යාපෘතීන් අදාල කාලසීමාව තුල උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුය |

## 3.7 විදේශ ආධාර ව්‍යාපෘති

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **නිවාස 4000 ඉදිකිරීමේ ව්‍යාපෘතිය - I හා II වන අදියර**<br>2021 වර්ෂයේ නිවාස ඒකක 424 ක ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීමේ ඉලක්කයක් ස්ථාපිත කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉදිකිරීම් සම්පූර්ණ කර තිබූ නිවාස ඒකක ගණන 266 ක් පමණක් වූ අතර එහි භෞතික ප්‍රගතිය සියයට 62.8 ක මට්ටමක පැවතුනි. තවද 2016 වර්ෂයේ සිට ආරම්භ කර පැවැත එන මෙම ව්‍යාපෘතියෙහි සමාලෝචිත වර්ෂය අවසාන (2021) වන විට වසර 05 කාලයක් ඉකුත් වී ඇතත් අපේක්ෂිත ප්‍රතිලාභ මට්ටමට ලඟාවීම සියයට 48.43 ක් වූ අවම මට්ටමක පැවතුණි. | නිවාස 4000 ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි මේ වන විට නිවාස 3799ක් සාදා නිම කර ඇති අතර ඉන් 3328ක් නිවාස ප්‍රතිලාභීන් වෙත භාර දී ඇත. තවත් නිවාස 470ක් ප්‍රතිලාභීන් අතට පත් කිරීමට සූදානම් කරමින් පවතී. රට තුළ පැවැති කොවිඩ්-19 වසංගත තත්වය හා අමුද්‍රව්‍ය හිඟය නිසා මෙම නිවාසයන්හි ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීමට නොහැකි විය. | විදේශ ආධාර ව්‍යාපෘති උපරිම කාර්යක්ෂමතාවයකින් අදාල කාලය තුල සම්පූර්ණ කර ප්‍රතිලාභීන් වෙත ලබා දීමට කටයුතු කල යුතුය. |
| (ආ) **නිවාස 4000 ක් සඳහා යටිතල පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය**<br>2016 වර්ෂයේ දී කැබිනට් අනුමැතිය හිමිව නිවාස ඒකක 4000 ක් ඉදිකර ප්‍රතිලාභීන් වෙත භාරදීමේ අරමුණ ඇතිව ආරම්භ කරන ලද නිවාස ව්‍යාපෘතියෙහි 2021 වර්ෂය සඳහා නිවාස ඒකක 3301 ක් සඳහා යටිතල පහසුකම් ලබා දීමට | නිවාස 4000 ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි යටිතල පහසුකම් සඳහා ප්‍රතිපාදන වෙන්වූයේ 2021 වර්ෂයේ මාර්තු මස දී වන අතර 2021.10.04 දින වන විට මෙහි පළමු අදියරයේ නිවාස ඒකක 1057න් නිවාස 701ක් ද දෙවන අදියර | -එම- |

| | | | |
|---|---|---|---|
| | පමණක් රුපියල් මිලියන 522.2 ප්‍රතිපාදන ලබා දී තිබූ අතර ඉන් රුපියල් මිලියන 385 වැය කර නිවාස 1898 කටයුතු නිම කර තිබුණි. මෙම ව්‍යාපෘතියෙහි මූල්‍ය ප්‍රගතිය සියයට 73.77 ක් වුවද භෞතිකව ළඟා කරගෙන තිබූ ප්‍රගතිය සියයට 57.49 ක් තරම් අවම මට්ටමක පැවතුණි. තවද යටිතල පහසුකම් සම්පූර්ණ කරන ලද නිවාස 3799 ක් අතුරින් වතු ප්‍රජාව වෙත භාරදුන් නිවාස ගණන 1936 ක් වුවෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා කර ගැනීමේ ප්‍රගතිය සියයට 50 ක් තරම් වූ අවම මට්ටමක පැවතුණි. | යටතේ නිවාස ඒකක 2943න් නිවාස ඒකක 1235ක් ද වශයෙන් නිවාස ඒකක 1936ක් මේ වන විට ප්‍රතිලාභීන් වෙත භාර දී ඇති බව කාරුණිකව වාර්තා කරමි.<br>මේ වන විට ඉන් නිවාස 471ක් ප්‍රතිලාභීන් වෙත භාර දීමට සූදානම් අතර තවත් නිවාස 154ක ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතින බවත් රටතුළ පැවැති කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් නිවාස ව්‍යාපෘතීන්හි මූලික කටයුතු රාශියක් අපේක්ෂිත ලෙස ඉටු කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් නිවාස ව්‍යාපෘතීන්හි ඉදිකිරීම් කටයුතු සැලසුම් කළ කාලයට අනුව අවසන් කිරීමට නොහැකි වී ඇති බවත් කාරුණිකව වාර්තා කරමි. | |
| (ඇ) | 2018 වර්ෂයේ ලද අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය දෙවන අදියරෙහි පළමු කොටසේ නිවාස 5000ක් වෙනුවෙන් කළමනාකරණ ගාස්තු ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. 2019 වර්ෂයේදී රු.මි.10ක් වැවිලි මානව සංවර්ධන භාරය වෙත ගෙවා ඇති අතර 2021 දෙසැම්බර් 31 වන විට වසර තුනක කාලයක් ගත වී පැවතිය ද කිසිදු නිවාසයක වැඩ කටයුතු ආරම්භ කර නොතිබුණි. නිවාස 3525 ක් සඳහා ඉදිකිරීම් ස්ථාන පමණක් හඳුනා ගෙන තිබුණි. | වැවිලි මානව සංවර්ධන භාරය වෙත නිවාස 10,000ක ඉදිකිරීම් කටයුතු සඳහා කළමනාකරණ ගාස්තුව ලෙස රු. මි.10ක මුදලක් ගෙවා ඇති අතර තවමත් එහි වැඩ ආරම්භ කර නොමැත. මෙම ව්‍යාපෘතියට අදාළව ඇතැම් ව්‍යාපෘති සඳහා දැනට NBRO වාර්තා ලබා ගැනීම සහ නිවාස 3525කට අදාළව භූමිය හඳුනාගෙන ඇත. නිවාස 4000ක ඉදිකිරීම් කටයුතු මේ වන විට සම්පූර්ණයෙන් අවසන් කර නොමැති වීමත්, කොවිඩ්-19 වසංගතය හමුවේ පැවැති දුෂ්කරතාවයන් හේතුවෙන් සහ මේ වන විට රට තුළ පවතින උද්ධමනකාරී ආර්ථික තත්වයන් මෙම ප්‍රමාදයට හේතු වී ඇති බව කාරුණිකව වාර්තා කරමි.<br>මෙම අදියරයේ නිවාස ඉදිකිරීම් ආරම්භ කළ පසු මෙම ගෙවා ඇති කළමනාකරණ ගාස්තු ආවරණය කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව වාර්තා කරමි. | -එම- |

## 3.8 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මවුන්ට් වර්නන් වතුයායේ මැද කොටසේ නිවාස ව්‍යාපෘතියට අදාළව අමාත්‍යාංශය විසින් වැවිලි මානව සංවර්ධන භාරයට ගෙවා ඇති මුළු මුදල වවුචර් අනුව රු.48,350,000 ක් ද , චෙක්පත්වල ඡායා පිටපත් අනුව රු.61,165,966 ක් ද , වැවිලි මානව සංවර්ධන භාරය විසින් විගණනයට ලබාදුන් ලිපිගොනුව අනුව රු.45,729,751 ක් වන බැවින් එම අගයන්හි එකිනෙකට වෙනස්කම් පැවති බව නිරීක්ෂණය වී තිබුණි. | මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් ගෙවන ලද සත්‍ය වියදම ර.45,340,388.50 ක් වේ. | ව්‍යාපෘතියට අදාල සියළු විස්තර නිවැරදිව ලිපිගොනුවට ඇතුලත් කල යුතුය. |
| (ආ) | හරිත රන් නිවාස වැඩසටහන යටතේ ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතුවල සියලු වියදම් අමාත්‍යාංශය විසින් දරනු ලබන අතර අංක අමප/17/0306/739/002 හා 2017 පෙබරවාරි 21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ එක් නිවසක වටිනාකම වූ රු.1,000,000 ක මුදලින් රු.480,000ක් ප්‍රදාන ලෙසත් අනෙක් රු.520,000ක මුදල ණයක් ලෙසත් දක්වා ඇති නමුත් මෙම ණය මුදල ප්‍රතිලාභීන්ගෙන් අයකර ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය හා ප්‍රතිලාභීන් අතර ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | එකඟ වෙමි. අමාත්‍යාංශ ප්‍රතිපාදන මගින් ඉදි කරනු ලබන වතු නිවාස ණය පදනම මත ලබා දීමත් ඉන්දියානු ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස ව්‍යාපෘති සම්පූර්ණ ප්‍රදාන පදනම මත ලබා දීමත් සිදු වේ. මෙම වැඩසටහන් දෙකම, එකම වත්තක් තුළ ක්‍රියාත්මක වන අවස්ථාවලදී ප්‍රතිලාභීන්ගෙන් ණය අයකර ගැනීම ගැටලුවක් ව පවතී.<br><br>ණය අයකර ගැනීම | ණය මුදල ප්‍රතිලාභීන්ගෙන් අයකර ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය හා ප්‍රතිලාභීන් අතර ගිවිසුමක් අත්සන් කර තිබිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි හෝ හරිත රන් නිවාස වැඩසටහන සඳහා පිළියෙල කර ඇති මඟපෙන්වීමේ හෝ ගිවිසුමේ අමාත්‍යාංශයට ණයගෙවීම ආරම්භකල යුත්තේ කුමන දිනක සිටද යන්න සඳහන් වී නොතිබුණි. අමාත්‍යාංශය තුල ණය හා පොලිය අයකරගැනීම සම්බන්ධව විධිමත් වාර්තා පවත්වා ගෙන නොයන අතර ඒ අනුව ණය හා පොලිය අයකිරීම නිසි පරිදි සිදු වී නොතිබුණි. | සම්බන්ධයෙන් නිවාස ප්‍රතිලාභීන් දැනුවත්කොට ණය ආපසු අය කර ගැනීම සඳහා වැවිලි ප්‍රජා සන්නිවේදන නිලධාරින් දැනුවත්කොට ඇති අතර නිවාස ව්‍යාපෘතිවලට අදාළ ණය අයකර ගැනීම් පිළිබඳ තොරතුරු අදාළ වතු සමාගම්වලින් හා වැවිලි මානව සංවර්ධන භාරයෙන් ද ගෙන්වා ගැනීම සඳහා ලිපි යොමු කර ඇත. | අමාත්‍යාංශය තුල ණය හා පොලිය අයකරගැනීම සම්බන්ධව විධිමත් වාර්තා පවත්වා ගෙන ඒ අනුව ණය හා පොලිය අයකිරීම කල යුතුය. |
| (ඈ) | මෙම ව්‍යාපෘති සඳහා රජයේ වාර්ෂික අයවැයෙන් මුදල් වෙන්කර ඒකබද්ධ අරමුදලින් එම මුදල් වියදම් කෙරෙන අතර ඒ අනුව මෙම නිවාස සඳහා ප්‍රතිලාභීන්ගෙන් ණය අයකර ගැනීම අමාත්‍යාංශයේ වගකීමක් වන බැවින් මෙම මුදල් ගෙවීම පැහැර හැරීම මත රජයේ මුදල් අවභාවිතය වී තිබුණි. | අදාළ තොරතුරු ලැබෙමින් පවතින අතර තව දුරටත් තොරතුරු ගෙන්වා ගනිමින් ණය අය කර ගැනීමේ කටයුතු විධිමත් කිරීමට කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | ණය අයකර ගැනීමට අමාත්‍යාංශය කටයුතු කල යුතු වේ. |
| (ඉ) | මෙම නිවාස ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඇති ගිවිසුම අනුව ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් හා ක්ෂේත්‍ර පරීක්ෂාවෙන් මාස 6 කට පසු රඳවාගැනීමේ මුදල නිදහස් කල යුතු වුවද අමාත්‍යාංශය විසින් රඳවා තබාගත් මුදල වන රු.5,225,000 ක වටිනාකම මාස 6 ක් ගතවීමට පෙර එනම් 2019 අගෝස්තු 16 දින 472461 දරණ චෙක්පත යටතේ වැවිලි මානව සංවර්ධන භාරයට ගෙවීම් කර තිබුණි. එම නිසා ඉදිකිරීම් දෝෂ හා අඩුපාඩු වෙනුවෙන් කොන්ත්‍රාත්කරුගෙන් අයකරගැනීමට ඇති හැකියාව අමාත්‍යාංශයට ගිලිහීගොස් තිබුණි. | මෙම ව්‍යාපෘතියට අදාළව ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාවෙහි ඉංජිනේරු අංශයේ නිර්දේශය මත රැඳවුම් මුදල් නිදහස් කර ඇති අතර, ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාව අනුව 2017 දෙසැම්බර් මස නිවාස ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කොට 2018 ජනවාරි මස ප්‍රතිලාභීන් වෙත භාර දී ඇති බවත් සඳහන් කර ඇති බව කාරුණිකව දන්වමි. | නිවාස ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඇති ගිවිසුම අනුව අනුව කටයුතු කල යුතු වේ. |
| (ඊ) | මෙම නිවාස ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2022 පෙබරවාරි 23 වන දින සිදුකරන ලද භෞතික පරීක්ෂාව අනුව ඉදිකර නිමකර තිබූ නිවාස 55 ක් 2018 ජනවාරි මස ප්‍රතිලාභීන්ට භාර දී තිබුණද එයින් නිවාස 03 ක ප්‍රතිලාභීන් තවමත් පදිංචි වී නොමැති බවත් නිවාස හතක විවිධ පැලීම් හා ඉරිතැලීම් නිරීක්ෂණය වී තිබුණි. | ප්‍රතිලාභීන් වෙත නිවාස භාරදී ඇති බැවින් ඒ පිළිබඳව වතු නිවාස සමිති විසින් කටයුතු කළ යුතුය. | නිවාස නිසි ප්‍රමිතියෙන් අදාල කාලය තුල සම්පූර්ණ කර ප්‍රතිලාභීන් වෙත ලබා දීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඍ) | **පසුගාමී ප්‍රදේශවල සමාජ ආර්ථික පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය**<br>මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි.500ක් ප්‍රතිපාදනය කර තිබූ අතර අපේක්ෂිත කාර්යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී හැටන්, නුවරඑළිය, නුවර, කෑගල්ල හා ගාල්ල යන කලාප 05 තුළ යටිතල පහසුකම් ව්‍යාපෘති 64ක් වෙනුවෙන් රු.96,018,835ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණි. ඉන් එක් ව්‍යාපෘතියක් පමණක් සම්පූර්ණ කරමින් දරන ලද වියදම රු.35,059,488කි. ඒ අනුව සියයට 36.5ක මූල්‍ය ප්‍රගතියක් පමණක් ළඟාකරගෙන තිබූ අතර ප්‍රමාණවත් භෞතික ප්‍රගතියක් ළඟාකරගෙන නොතිබුණි. | පිළිගනිමි. පැවැති කොවිඩ්-19 වසංගත තත්වයේ බලපෑම හේතුවෙන් ඇති වූ අමුද්‍රව්‍ය හිඟය, අමුද්‍රව්‍ය මිල ශීඝ්‍රයෙන් ඉහළ යාම මත ඇස්තමේන්තු මිල ගණන් යටතේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමේ අපහසුතා පැවතුණි. ඇතැම් ව්‍යාපෘති ප්‍රදේශ කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් lock-down කර තිබීමත්, අයහපත් කාලගුණ තත්ත්වයන් පැවතීමත් යනාදි හේතූන් මත ව්‍යාපෘතීන්හි ඉදිකිරීම් ප්‍රමාද වී ඇති බව කාරුණිකව වාර්තා කරමි.<br>මේ වන විට ආදාළ ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතින බවත් ඇතැම් ව්‍යාපෘතීන්හි ඉදිකිරීම් කටයුතු නිම කර ඇති බවත් කාරුණිකව වාර්තා කරමි. | ව්‍යාපෘති උපරිම කාර්යක්ෂමතාවයකින් අදාල කාලය තුල සම්පූර්ණ කර ප්‍රතිලාභීන් වෙත ලබා දීමට කටයුතු කල යුතුය. |
| (ඎ) | **ගෞරවිල නිවාස A හා B ව්‍යාපෘතියේ භෞතික පරීක්ෂාව**<br>අමාත්‍යාංශය මගින් නිවාස ඉදිකිරීම සඳහා පිළියෙල කර ඇති මහපෙන්වීම අනුව නිවසක වටිනාකමෙන් රු.494,000ක් , 4% ක පොලී අනුපාතයක් යටතේ ණය පදනමින් වන අතර ඉතිරි රු.506,000 ක මුදල අමාත්‍යාංශය විසින් දරනු ලබයි. ඉහත ණය මුදල මාසික වාරිකය රු.3,800ක් බැගින් වාරික 180 කින් අයකිරීමට දක්වා තිබුනද 2022 මාර්තු 01 දින වන විටත් ගෞරවිල නිවාස A හා B ව්‍යාපෘතියේ කොටස් දෙකෙන් එම ණය මුදල් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වෙමි. නිවාස ණය අයකර ගැනීම සම්බන්ධයෙන් නිවාස ප්‍රතිලාභීන් දැනුවත්කොට ණය ආපසු අය කර ගැනීම සඳහා වැවිලි ප්‍රජා සන්නිවේදන නිලධාරින් දැනුවත්කොට ඇත. නිවාස ව්‍යාපෘතිවලට අදාළ ණය අයකර ගැනීම් පිළිබඳ තොරතුරු අදාළ වතු සමාගම්වලින් හා වැවිලි මානව සංවර්ධන භාරයෙන් ද ගෙන්වා ගැනීම සඳහා ලිපි යොමු කර ඇත. | අමාත්‍යාංශය තුල ණය හා පොලිය අයකරගැනීම සම්බන්ධව විධිමත් වාර්තා පවත්වා ගෙන ඒ අනුව ණය හා පොලිය අයකිරීම කල යුතුය. |
| (එ) | ගෞරවිල නිවාස B ව්‍යාපෘතියේ කොටසේ මුළු රැඳවුම් මුදල් රු 1,615,000 මුදලක් නිදහස් කර ඇති මුත් 2021 ඔක්තෝබර් 12 දින වැවිලි මානව සංවර්ධනභාරය ලිපිය මගින් නිවාස 02 ක් සඳහා හානි සිදු වී ඇති බවත් එම නිවෙස් පිහිටි බිම නායයෑමට ලක්වීම ඊට හේතුව ලෙසත් දක්වා ඇත . ඉඩමෙහි හු විෂමතාවට අනුකූලව ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ ලබාදී | එකඟ වෙමි. ඉදිරියේදී නිවාස ව්‍යාපෘති සැලසුම් කිරීමේදී මෙවැනි දුර්වලතා මග හරවා ගෙන කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | නිවාස නිසි ප්‍රමිතියෙන් යුතුව සම්පූර්ණ කර ප්‍රතිලාභීන් වෙත ලබා දීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබු NBRO වර්තාවලට අනුව හා සැලසුමට අනුකුලව භූමියෙහි ප්‍රමාණය හා එහි තත්වය සලකා බලා උචිත පරිදි නිවාස සැලසුම ඉඩමෙහි ස්ථානගත කිරීමට හෝ ආරක්ෂිත පියවර ගැනීමට කටයුතු නොකිරීමෙන් පදිංචි නිවැසියන්ට හානි වීමේ අවදානමක් පැවතුණි. | | |
| (ඒ) | නිවාස ඉදිකිරීම් වලට සමගාමීව යටිතල පහසුකම් ව්‍යාපෘතියද සිදුකිරීමට සැලසුම් නොකිරීම හේතුවෙන් 2019 දෙසැම්බර් මස නිවෙස් වල ඉදිකිරීම් අවසාන වුවත් ජලය හා විදුලිය , ප්‍රවේශ මාර්ග නොමැති වීම නිවෙස් වල පදිංචියට නොපැමිණීමට හේතු වී තිබුණි. | එකඟ වෙමි. ඉදිරියේදී නිවාස ව්‍යාපෘති සැලසුම් කිරීමේදී මෙවැනි දුර්වලතා මග හරවා ගෙන කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | නිවාස ව්‍යාපෘති සැලසුම් කිරීමේදී ඉදිකිරීම් වලට සමගාමීව යටිතල පහසුකම් ව්‍යාපෘතියද සිදු කල යුතුය. |
| (ඔ) | ගෞරවිල නිවාස A ව්‍යාපෘතිය කොටසේ ප්‍රතිලාභීන් වෙත නිවාස 23 ක් භාරදී තිබු අතර එයින් රු.19,000,000 වටිනා නිවාස 19 ක ප්‍රතිලාභීන් පදිංචියට පැමිණ නොතිබුණි.<br>එම නිවාස 2019 දෙසැම්බර් මස ඉදිකිරීම් අවසන් වුවද ප්‍රතිලාභීන් වෙත නිවාස ලබා දී ඇත්තේ 2021 දෙසැම්බර් 16 වන දිනදී ය. | අදාල වතු සමිතිය මඟින් ප්‍රතිලාභීන් පදිංචි කිරීම සිදු කල යුතුවේ. | ව්‍යාපෘති උපරිම කාර්යක්ෂමතාවයකින් අදාල කාලය තුල සම්පූර්ණ කර ප්‍රතිලාභීන් වෙත ලබා දීමට කටයුතු කල යුතුය. |
| (ඕ) | 2009 සිට 2014 වර්ෂය දක්වා නිකුත් කරන ලද වතු නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 2 ඡේදය අනුව පැවති පේලි නිවාස හෝ තාවකාලික මඩු වැනි දෑ නැවත භාරදීමේ එකඟතාවය මත නව නිවාස භාරදීම සිදු කළ යුතු විය. එහෙත් ප්‍රතිලාභීන් තෝරාගැනීම සහ ගිවිසුම් අත්සන් කිරීම් වැනි ක්‍රමවේදයක් භාවිතා කර නොතිබුණි.<br>ගෞරවිල නිවාස A ව්‍යාපෘතියේ නිවාස ප්‍රතිලාභීන් වෙත ලබාදුන් නිවාස 23 න් 19 ක ප්‍රතිලාභීන් පදිංචි නොවීම හේතුවෙන් හා එම පැරණි නිවාස වලින් ඉවත්වීම සිදු නොවීමෙන් පැරණි පේළි නිවාස ඉවත් කිරීමට නොහැකි වී තිබුණි.එම නිසා ඉඩම් වෙනත් කටයුතු සඳහා භාවිතා කිරීමටද නොහැකි වී තිබුණි. | අදහස් දැක්වා නැත | ව්‍යාපෘති උපරිම කාර්යක්ෂමතාවයකින් අදාල කාලය තුල සම්පූර්ණ කර ප්‍රතිලාභීන් වෙත ලබා දීමට කටයුතු කර දැනට ඔවුන් පදිංචි ඉඩම් පවරා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ක) | ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් නිවාස ව්‍යාපෘති සඳහා වූ මාර්ගෝපදේශය අනුව නිවාස ප්‍රතිලාභීන් තේරීමේදි වත්තේ ලියාපදිංචි සේවකයකු වීම අනිවාර්යවිය යුතුය යන්න දක්වා තිබුණද ගෞරවිල A නිවාස ව්‍යාපෘතියේ, අමාත්‍යාංශයේ ලිපි ගොනුවේ ඇතුලත් නිවෙස් හිමි ප්‍රතිලාභීන්ගේ තොරතුරු ඇතුලත් ලැයිස්තුවේ සේවක අර්ථසාධක | එකඟ වෙමි.<br>ලිපි ගොනුවේ ඇතුළත් නිවාස හිමි ප්‍රතිලාභී ලේඛනයේ සේවක අර්ථසාධක අංකය නොමැති ප්‍රතිලාභීන් තිදෙනෙකු ඇතුළත් වන බව නිරීක්ෂණය වන අතර, ඒ පිළිබඳ විමසීම් කර වැවිලි මානව සංවර්ධන භාරය වෙත | ව්‍යාපෘතියට අදාල සියළු විස්තර ලිපිගොනුවලට ඇතුලත් කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අංකය නොමැති ප්‍රතිලාභීන් 03 කු ඇතුලත් වී තිබුණි. | ලිපියක් යොමු කරන ලදි. අදාළ තොරතුරු ලද විගස විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | |
| (ග) | **කෙග්ලියා නිවාස ව්‍යාපෘතිය ඉදිකරන ලද නිවාස උපයෝජනය නොකිරීම**<br>කෙග්ලියා අංශයේ 2019 ජනවාරි 10 දින වැඩ ආරම්භ කර 2019 ඔක්තොම්බර් 15 දින වැඩ අවසන් කර භාර දී තිබූ රු. 29,060,000 ක් වැයකර ඉදිකර තිබූ නිවාස ඒකක 30 කින් විගණන දිනය වන 2022 පෙබරවාරි 23 වන විටත් නිවාස 20 ක ප්‍රතිලාභීන් පදිංචියට පැමිණ නොසිටි බව අනාවරණය විය. ඒ අනුව දරා තිබූ වියදමින් රු. 19,373,334 ක වියදමට අදාලව ප්‍රතිලාභ මහජනතාව වෙත ලැබී නොමැති බවත් එම වත්කම් නිශ්කාර්යයව පවතින බවත් ඒ සඳහා අමාත්‍යාංශය විසින් අධීක්ෂණයක් හෝ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු බවත් නිරීක්ෂණය විය. | ප්‍රතිලාභීන් පදිංචි නොවීම සම්බන්ධයෙන් වැවිලි මානව සංවර්ධන භාරය හා වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා නිලධාරින් වෙතින් තොරතුරු ලබාගෙන විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | ව්‍යාපෘති උපරිම කාර්යක්ෂමතාවයකින් අදාල කාලය තුල සම්පූර්ණ කර ප්‍රතිලාභීන් වෙත ලබා දීමට කටයුතු කර දැනට ඔවුන් පදිංචි ඉඩම් පවරා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ච) | **ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීමේ ගැටළු**<br>වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සපයන්නන් ලෙස අමාත්‍යාංශය විසින් බඳවා ගන්නා ලද නිලධාරීන් වෙත ලබා දෙනු ලැබූ රාජකාරි ලැයිස්තුවේ ඡේද අංක 01 යටතේ, ක්‍රියාත්මක වන නිවාස ව්‍යාපෘති වල ක්ෂේත්‍ර කටයුතු නිරීක්ෂණය කිරීම, තොරතුරු රැස් කිරීම, අධ්‍යයනය කිරීම, ඉදිකිරීම් කටයුතු පරීක්ෂා කිරීම, ගෙවීම් කිරීම සඳහා නිර්දේශ නිසි වේලාවට ඉදිරිපත් කිරීම ආදී කටයුතු සිදු කල යුතු බව දක්වා තිබූ නමුත් භාරදුන් නිවාස වල ප්‍රතිලාභීන් පදිංචි වී නොමැති බව අමාත්‍යාංශයට අදාල නිලධාරීන් විසින් වාර්තා කර නොතිබුණි. | එකඟ වෙමි. අමාත්‍යාංශයීය සැලසුම් අංශය විසින් වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර, රාජකාරී පිළිබඳ දැනුවත් කිරීම් සිදු කරන ලද බව කාරුණිකව දන්වමි. | තොරතුරු ක්‍රමවත්ව සංනිවේදනය විය යුතු අතර ඒ අනුව නිවැරදි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඡ) | **නිවාස ව්‍යාපෘතිය සැලසුම් කිරීමේ දුර්වලතා.**<br>නිවාස ඉදිකිරීම සඳහා තොරාගන්නා ලද තේ වතු ඉතා දුෂ්කර ප්‍රදේශ වල පිහිටා ඇත. එම ස්ථාන කරා ලගා වීම සඳහා මූලික මාර්ගය හා එක් එක් නිවාස වෙනුවෙන් අතුරු මාර්ග සංවර්ධනය කිරීමත්, අදාල නිවාස ව්‍යාපෘති වල මූලිකම අවශ්‍යතාවයන් ලෙස සැලකෙන ජල පහසුකම් හා විදුලිබල පහසුකම් සම්පාදනය කර ලබා දීමද නිවාස ව්‍යාපෘතියේ කොටසක් ලෙසම ඇතුලත් කර ප්‍රතිපාදන වෙන් කරවා අදාල නිවාස ව්‍යාපෘතිය සමග සමාන්තර ආකාරයට සැලසුම් කර ක්‍රියාත්මක කිරීමත් කල යුතුව තිබුණි. එසේ සැලසුම් | එකඟ වෙමි. ඉදිරියේදී නිවාස ව්‍යාපෘති සැලසුම් කිරීමේදී මෙවැනි දුර්වලතා මග හරවා ගෙන කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | නිවාස ව්‍යාපෘති සැලසුම් කිරීමේදී ඉදිකිරීම් වලට සමගාමීව යටිතල පහසුකම් ව්‍යාපෘතිද සිදුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිරීමකින් තොරව නිවාස ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසු මාර්ග, ජල පහසුකම් හා විදුලි පහසුකම් සඳහා වෙනත් ව්‍යාපෘතියන් සැලසුම් කිරීම නිසා නිවාස ඉදිකිරීම් අවසන් කලද අදාල ප්‍රතිලාභීන් හට නිවාස වල පදිංචි වීමේ ගැටළු සහගත තත්වයක් ඇති වී තිබුණි. | | |
| (ට) | මාර්ගෝපදේශ සංග්‍රහය අනුව එක් නිවාසයක් වෙනුවෙන් පර්චස් 07 ක් වෙන්කල යුතු බව දක්වා තිබුනද ව්‍යාපෘතිය ආරම්භයේදී මැණීම් සිදුකර මිනුම්දෝරු සැලැස්මක් සකස් කර තිබූ නමුත් භෞතිකව පරීක්ෂා කරන ලද නිවාස 30 ට අදාලව බොහෝ ස්ථාන වල මායිම් කණු නොමැති බවත් ලබා දී තිබූ පර්චස් 07 ඉක්මවා අදාල ප්‍රතිලාභීන් විසින් ඉඩම් අල්ලා ගැනීමට කටයුතු කර ඇති බවත් ඒ අනුව සමහර භූමිවල පස් සේදී යාමට භාජනය වීම හේතුවෙන් පසුව නායයෑමේ අවධානම් පැවති බවත් නිරීක්ෂණය විය. | එකඟ වෙමි. නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මෙවැනි දුර්වලතා මග හරවා ගැනීමට කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | නිවාස ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඇති ගිවිසුම අනුව අනුව කටයුතු කල යුතු වේ. |

## 3.9 ප්‍රසම්පාදනයන්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළි නොපැදීම.**<br>ප්‍රසම්පාදන මාර්ගෝපදේශනයේ හා ප්‍රසම්පාදන මහපෙන්වීමේ 3.9.4 ඡේදය ප්‍රකාරව සමූපකාර සමිති වෙත එකතුව රු.මිලියන 2 කට වඩා වැඩි කොන්ත්‍රාත් නොදිය යුතු අතර නිශ්චිත කාලයක් තුල සමිතියක් විසින් ඉටුකරනු ලබන මුළු කොන්ත්‍රාත් සංඛ්‍යාව තුනකට නොවැඩි විය යුතුය. එහෙත් වැවිලි මානව සංවර්ධන භාරය මඟින් ඉටුකරනු ලැබූ මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා අමාත්‍යාංශය වෙනුවෙන් වතු සේවක නිවාස සමූපකාර සමිති සමඟ රු. 28,500,000 ක වටිනාකමකට නිවාස ඒකක 30 ක් ඉදිකිරීම වෙනුවෙන් ගිවිසුම්ගතවී තිබූ බවත් ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ දක්වා ඇති සීමාවන් ඉක්මවා කටයුතු කරතිබුණි. | එකඟ වෙමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශනයේ හා ප්‍රසම්පාදන මහපෙන්වීම අනුව කටයුතු කල යුතු වේ. |

## 3.10 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ නිවාස ව්‍යාපෘතිය යටතේ නව නිවාස 150ක් ඉදිකිරීමට අදාළව ෆෝඩයිස් (fordyse) වතුයායේ නිවාස ඒකක 19ක් ඉදිකිරිම සඳහා කිසිදු කාර්යයන් ආරම්භකර නොතිබියදී 2020 දෙසැම්බර් 31 දිනට රු.570,000ක් කළමනාකරණ ගාස්තු ලෙස වැවිලි මානව සංවර්ධනභාරය වෙත ගෙවීම් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේද වැඩ ආරම්භකිරීමේ අත්තිකාරම් ලෙස රු.27,840,000ක මුදලක් ගෙවීම් කර තිබුණද කිසිදු ව්‍යාපෘතියක් අපේක්ෂිත මට්ටමට ළඟා වී නොතිබුණි. | පිළිගනිමි. වතු සමාගම්වලින් ඉඩම් නිදහස් කර ගැනීම, NBRO වාර්තා ලබා ගැනීම, එම කාලය තුළ රටේ පැවැති අධික කොරෝනා වසංගත තත්වය ද හේතුවෙන් එම මූලික කටයුතු අපේක්ෂිත ලෙස ඉටු කර ගැනීමට බාධාකාරී විය. එසේම වර්ෂය තුළ සිදු වූ ගොඩනැගිලි අමුද්‍රව්‍ය මිල ඉතා සීඝ්‍රයෙන් ඉහළ යාම හා අමුද්‍රව්‍ය හිඟය හේතුවෙන් ව්‍යාපෘතීන්හි ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීමෙන් ව්‍යාපෘති අවසන් කිරීමට අපොහොසත් වී ඇති බව කාරුණිකව වාර්තා කරමි.<br>මේ වන විට ආදාළ ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතින බවත් කාරුණිකව වාර්තා කරමි. | ව්‍යාපෘති උපරිම කාර්යක්ෂමතාවයකින් අදාල කාලය තුල සම්පූර්ණ කර ප්‍රතිලාභීන් වෙත ලබා දීමට කටයුතු කල යුතුය. |

## 3.11 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය විසින් 2015,2016,2017 හා 2018 වසර වලදී කලාප 07ක වතු 55ක් ආවරණය කරමින් රු.292,025,000ක් වටිනා නිවාස ඒකක 1159 ප්‍රතිලාභීන් වෙත ණය පදනම මත ලබා දී තිබුණි.ඉන් නිවාස ඒකක 307ක් වෙනුවෙන් අයවිය යුතු රු.82,550,000න් කිසිඳු මුදලක් 2021 දෙසැම්බර් 31 වන විටත් අයකරගෙන නොතිබුණි. | එකඟ වෙමි. අමාත්‍යාංශ ප්‍රතිපාදන මගින් ඉදි කරනු ලබන වතු නිවාස ණය පදනම මත ලබා දීමත් ඉන්දියානු ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස ව්‍යාපෘති සම්පූර්ණ ප්‍රදාන පදනම මත ලබා දීමත් සිදු වේ. මෙම වැඩසටහන් දෙකම, එකම වත්තක් තුළ ක්‍රියාත්මක වන අවස්ථාවලදී ප්‍රතිලාභීන්ගෙන් ණය අයකර ගැනීම ගැටලුවක් ව පවතී. | අමාත්‍යාංශය තුල ණය හා පොලිය අයකරගැනීම සම්බන්ධව විධිමත් වාර්තා පවත්වා ගෙන ඒ අනුව ණය හා පොලිය අයකිරීම කල යුතුය. |
| (ආ) | අංක SMEHCI/05/05/40 හා 2022 පෙබරවාරි 15 දිනැති ලිපිය මඟින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව අමාත්‍යාංශය විසින් නව ජීවන නිවාස ව්‍යාපෘතිය යටතේ 2021 දෙසැම්බර් 31 දිනට අයකරගෙන තිබූ මුළු මුදල රු. 83,203,372 ක් වූ අතර එය මුළු ණය මුදලින් සියයට 28.49ක අවම මට්ටමක පැවතුණි. | ණය අයකර ගැනීම සම්බන්ධයෙන් නිවාස ප්‍රතිලාභීන් දැනුවත්කොට ණය ආපසු අය කර ගැනීම සඳහා වැවිලි ප්‍රජා සන්නිවේදන නිලධාරින් දැනුවත්කොට ඇති අතර නිවාස ව්‍යාපෘතිවලට අදාළ ණය අයකර ගැනීම් පිළිබඳ තොරතුරු අදාළ වතු සමාගම්වලින් හා වැවිලි මානව සංවර්ධන භාරයෙන් ද ගෙන්වා | අමාත්‍යාංශය තුල ණය හා පොලිය අයකරගැනීම සම්බන්ධව විධිමත් වාර්තා පවත්වා ගෙන ඒ අනුව ණය හා පොලිය අයකිරීම කල යුතුය. |

ගැනීම සඳහා ලිපි යොමු කර ඇත.

ඒ අනුව අදාළ තොරතුරු ලැබෙමින් පවතින අතර තව දුරටත් තොරතුරු ගෙන්වා ගනිමින් ණය අය කර ගැනීමේ කටයුතු විධිමත් කිරීමට කටයුතු කිරීමට සටහන් කර ගතිමි.

(ඇ) **2018 වර්ෂයේ ආරම්භ කරන ලද හරිත රන් නිවාස ව්‍යාපෘතියේ සමස්ථ ප්‍රතිපාදනය.**

2018 වර්ෂයේදී පමණක් ආරම්භකර තිබු හරිත රන් නිවාස ව්‍යාපෘතියේ කලාප 07 ක් යටතේ වතු 83 ක් වෙනුවෙන් නිවාස ඒකක 1,657 ක් ඉදිකිරීම සැලසුම් කර තිබුණි. මෙම නිවාස සියල්ල වෙනුවෙන් රු. 1,657,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2017 පෙබරවාරි 21 දිනැති හා අංක අමප/17/0306/739/002 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රු. 861,640,000 ක් ණය වශයෙන් හා රු. 795,000,000 ක් දේශීය ආධාර යටතේත් මෙ නිවාස ඉදි කිරීමට තීරණය කර තිබූ නමුත් සමස්ථ වියදමම දේශීය අරමුදල් යටතේ ගෙවීම් කර ඉදිකිරීමෙන් අනතුරුව අදාල ප්‍රතිලාභීන් වෙත නිවාස පිරිනැමීමෙන් අනතුරුව ණය වාරික වශයෙන් අයකර ගත යුතු බවට තීරණය වී තිබුණි. එහෙත් එසේ අයකර ගැනීමට අපොහොසත් වීම නිසා දේශීය අරමුදලට සමස්ථ වියදම වූ රු. 1,657,000,000 ම වැය බරක් වන බවත් මෙම නිවාස ඉදිකිරීමේ අධීක්ෂණ කටයුතු වෙනුවෙන් එක් නිවාසයක ඉදිකිරීම් පිරිවැය වූ රු. 950,000 කින් සියයට 7 ක කළමණාකරණ ගාස්තුවක් එනම් රු. 110,190,500 ක් (950,000* 7%*1657)වැවිලි මානව සංවර්ධන භාරය වෙත ගෙවිය යුතුවිය. මෙයද දේශීය අරමුදලට විශාල වැය බරක් වන අතර මෙම ව්‍යාපෘති බොහොමයක් ඉතා දුෂ්කර ලගා වීමට අපහසු ඉඩම් වල ඉදිකිරීම් කරනු ලබන හෙයින් ඒ වෙනුවෙන් මාර්ග සංවර්ධනය කිරීමටත් ජල පහසුකම් පද්ධති ඇති කිරීමටත් විදුලි බල පහසුකම් ඇති කිරීමටත් අවම වශයෙන් එක් නිවාස ව්‍යාපෘතියක් වෙනුවෙන් රු.5,000,000 ක ප්‍රතිපාදනයක් වෙන් කර යුතු විය. තවද ඒ සඳහා ද නිවාස ව්‍යාපෘති 83 වෙනුවෙන්

එකඟ වෙමි. ඉදිරියේදී නිවාස ව්‍යාපෘති සැලසුම් කිරීමේදී මෙවැනි දුර්වලතා මග හරවා ගෙන කටයුතු කිරීමට සටහන් කර ගතිමි.

එමෙන්ම නිවාස ණය අයකර ගැනීම සම්බන්ධයෙන් නිවාස ප්‍රතිලාභීන් දැනුවත්කොට ණය ආපසු අය කර ගැනීම සඳහා වැවිලි ප්‍රජා සන්නිවේදන නිලධාරින් වෙත දැනුම් දී ඇති අතර නිවාස ව්‍යාපෘතිවලට අදාළ ණය අයකර ගැනීම් පිළිබඳ තොරතුරු අදාළ වතු සමාගම්වලින් හා වැවිලි මානව සංවර්ධන භාරයෙන් ද ගෙන්වා ගැනීම සඳහා ලිපි යොමු කර ඇති බව කාරුණිකව දන්වමි.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සඵලදායීත්වය හා කාර්යක්ෂමතාවය පිළිබඳ නිසි සැලකිල්ලකින් යුක්තව රජයේ අරමුදල් භාවිතා කිරීම කල යුතුය.

| | | | |
|---|---|---|---|
| | රු. 415,000,000 ක (5,000,000 * 83) වෙන්කල යුතු බැවින් එම වියදමද දේශීය අරමුදලට වැය බරක් බව නිරීක්ෂණය විය.<br>මෙම නිවාස ව්‍යාපෘති වෙනුවෙන් ප්‍රතිලාභීන්ගෙන් මුදල් අය නොවීම මත සමස්ථයක් ලෙස දේශීය අරමුදලට රු.2,182,190,500 ක වැය බරක් දැරීමට සිදුවන බවත් එම සමස්ථ වැය බරම භාණ්ඩාගාරයට දැරීමට සිදුවන හෙයින් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සඵලදායීත්වය ප්‍රශ්නගත විය. | | |
| (ඇ) | මිලදී ගන්නා ලද මහන මැෂින් 50 ස්වයං රැකියාලාභීන් සඳහා ලබාදුන්නේ ද,එසේ ලබාදුන්නේ නම් ඒවා එම ස්වයං රැකියාලාභීන් භාරගත්තේ ද,එම ස්වයං රැකියාලාභීන් තෝරාගත්තේ කුමන පදනමක් මත ද යන්න පිළිබඳව තොරතුරු නොවූ අතර අමාත්‍යාංශය විසින් මුදල් වියදම් කර මිලදීගත් මහන මැෂින් පිළිබඳ පසුවිපරමක් හෝ කිසිදු තොරතුරක් අමාත්‍යාංශය සතුව නොතිබුණි. | සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනමේ නිර්දේශ මත මෙම මහන මැෂින් බෙදාදීම සිදු කළ අතර ප්‍රතිලාභීන් ලැයිස්තුවක් ගොනුවට ඇතුළත් කර ඇත. | අදාල තොරතුරු ප්‍රසම්පාදන ලිපිගොනුවට ඇතුලත් කර යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |
| (ඉ) | ඉන්දියානු රජය හා ශ්‍රී ලංකා රජය අතර ඇතිකරගත් අවබෝධතා ගිවිසුම අනුව "ව්‍යාපෘතියේ අරමුණ වන්නේ නිවාස 49,000 ක් ඉදිකිරීම හා දැඩි ලෙස හා අර්ධ වශයෙන් හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය හා ප්‍රතිසංස්කරණය සඳහා සහය වීම" වන නමුත් එම අරමුණට පටහැනිව මෙම වැය විෂය සඳහා වෙන්වූ මුදලින් රු2,491,650ක් වැය කර ඩෙස්ක්ටොප් පරිගණක 15ක් අමාත්‍යාංශය සඳහා මිලදීගෙන තිබුණි. | මෙම ඩෙස්ක්ටොප් පරිගණක ප්‍රධාන වශයෙන් ඉංජිනේරු අංශය වෙත මිලදී ගැනීම සිදු කළ බැවින් අදාල වැය විෂයේ පරිපාලන වියදම් යටතේ මෙම ගෙවීම සිදු කර ඇත. | විශේෂ ව්‍යාපෘති වල අරමුදල් අදාල ව්‍යාපෘතියේ අරමුණු සඳහා පමනක් භාවිතා කල යුතු වේ. |
| (ඊ) | **වතු අංශයේ ස්වයං රැකියා ව්‍යාපෘතිය සඳහා පවත්වාගෙන යනු ලබන චක්‍රීය අරමුදල**<br>2021දෙසැම්බර් 31 දිනට ශේෂය රු.11, 082,224 ක් වනඅතර ඒ පිළිබඳ ශේෂ තහවුරු කිරීමේ ලිපි විගණනයට ඉදිරිපත් නොවුණි. | එකඟ වෙමි. 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය තහවුරු කිරීමේ ලේඛනයක් ලංකා බැංකුව වෙතින් ගෙන්වාගෙන නොපමාව විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | විගණනයට අවශ්‍ය තොරතුරු කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (එ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2187/27 හා 2020 අගෝස්තු 09 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය අනුව වෙනම ආයතනයක් ලෙස වතු අංශයේ ස්වයං රැකියා ව්‍යාපෘතිය සඳහා පවත්වාගෙන යනු ලබන චක්‍රීය අරමුදල ගැසට් කර තිබුණද මෙම අමාත්‍යාංශයේ සංවර්ධන අංශයේ වැඩසටහනක් වශයෙන් පවත්වාගෙන යනු ලබන බැවින් මුදල් රෙගුලාසි 877(2)(ඇ)විධිවිධාන අනුව ව්‍යවස්ථාපිත හා භාර අරමුදල් සඳහා මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යයසාධන වාර්තා ද ඉදිරිපත් නොවීය. | පිළිතුරු ලබා දී නොමැත. | මුදල් රෙගුලාසි 877(2)(ඇ)විධිවිධාන අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යයසාධන වාර්තා අදාළ ගිණුම් වර්ෂය අවසන් වී මාස 02ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුයි. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

**---------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය විසින් හඳුනාගෙන තිබූ තිරසාර සංවර්ධන අරමුණු 04ක් යටතේ ඊට අදාළව ඉලක්ක වැඩසටහන් 08ක් ක්‍රියාත්මක කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් වැඩසටහන් 05ක් සම්බන්ධයෙන් අපේක්ෂිත නිමවුම් මට්ටම සියයට 3.4 සිට සියයට 56ක අවම මට්ටමක පැවතුණි. | සමාලෝචිත වර්ෂය අවසන් වන විට අබලන් වූ ලයින් කාමර 1000ක වහල නැවත සෙවිලි නිරීමේ ව්‍යාපෘතියෙහි ප්‍රගතිය 3.4% අවම මට්ටමක අගයක් වාර්තා වි ඇත්තේ එම කාලපරිච්ඡේදය තුළ ලයින් කාමර සෙවිලි කිරීමට යොදා ගන්නා සෙවිලි තහඩු සඳහා භාවිතා කරනු ලබන සින්ක් ඇලුමිනියම් (Zn, Al) තහඩු හිඟ විම හා මිල අධික විම හේතුවෙනි.මෙම ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා විකල්ප වශයෙන් ඇස්බැස්ටෝස් යෙදීමට සාකච්ඡා කලද පවතින ලයින් කාමර බිත්ති ඊට ශක්තිමත් නොවන බව ඉංජිනේරුවන් විසින් පවසන ලද නිසා එම විකල්පය ක්‍රියාවට නැංවීමට ද නොහැකි විය.ප්‍රතිලාභීන් 500න් සඳහා වෘත්තිය පුහුණුව ලබාදීමේ ව්‍යාපෘතියෙහි ප්‍රගතිය 56% මට්ටමක පැවතීමට හේතුව වන්නේ එම වසර තුල පැවැති කොවිඩ් වංසගත තත්ත්වය නිසා සැලසුම් කළ පරිදි පුහුණු වැඩසටහන් ක්‍රියාවට නැංවීමට නොහැකි විම නිසාවෙනි. | තිරසාර සංවර්ධන අරමුණු ලගා කර ගැනීම සඳහා උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව කටයුතු කර අපේක්ෂිත නිමැවුම් මට්ටම උපරිමයෙන් ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2021.12.31 දිනට ජ්‍යෙෂ්ට මට්ටමෙ තනතුරු 08ක් සහ තෘතීය මට්ටමෙ තනතුරු 06 ඇතුළු තනතුරු 39ක් පුරප්පාඩුව පැවතුණි. අධ්‍යක්ෂ තනතුරු 02 බැගින්ද, අධ්‍යක්ෂ (ඉංජිනේරු), ඉංජිනේරු, සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ, ගණකාධිකාරී, අභ්‍යන්තර විගණක හා නීති නිලධාරී යන තනතුරු 01 බැගින් ද ජ්‍යෙෂ්ට මට්ටමේ තනතුරු 08ක් මෙසේ සම්පූර්ණ කිරීමෙන් තොරව පැවතුණි. | පුරප්පාඩු සංඛ්‍යාව නිවැරදි වේ. විධායක මට්ටමේ තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කර ඇත. | අත්‍යාවශ්‍යම තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර අමාත්‍යාංශයේ කටයුතු ක්‍රමවත්ව ඉටු කිරීමට කටයුතු කිරීම. |
| (ආ) | අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා ද්විතියික මට්ටමේ තනතුරු 35ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 03ක් ඇතුළු තනතුරු 38ක් අතිරික්තව පැවතුණි. ද්විතියික මට්ටමෙ අතිරික්ත තනතුරු සියල්ලම සංවර්ධන නිළධාරී තනතුරු වන අතර එය අනුමත කාර්යමණ්ඩලයෙන් (ද්විතියික මට්ටම) සියයට 284ක ඉක්මවීමකි. තවද මෙම අතිරික්ත සංවර්ධන නිළධාරීන් සඳහා වැටුප් වශයෙන් වසරකට රු.1,102,000ක (දළ වැටුප ලෙස) පමණ අතිරේක වියදමක් දැරීමට සිදුවී තිබුණි. | 2021.01.01 දින සිට සංවර්ධන නිලධාරි සේවයට පත්වීම් ලබාදී 2021.04.01 දින සිට සංවර්ධන නිලධාරින් 173 දෙනෙකු මෙම අමාත්‍යාංශයට අනුයුක්ත කරනු ලැබීය. රාජ්‍ය සේවා හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක CS/DOS/Policy/01/01(II) හා 2021.03.26 දිනැති ලිපියේ 6 වෙනි ජේදයේ 1 වනි වගන්තියට අනුකූලව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් තනතුරු අනුමත කර ගැනීමේ පදනමින් අදාල සංවර්ධන නිලධාරීන් මෙම අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ඇත. එම නිලධාරින්ගෙන් වෙනත් සේවා ස්ථානයන් වෙත ස්ථාන මාරු වී යාම් මත සංවර්ධන නිලධාරි නවක තනතුරු 35ක් අතිරික්තව පවතී. එම අතිරික්ත 35 දෙනා මෙම අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ගැනීමට සඳහා මු.රෙ. 70 යටතේ තනතුරු අනුමත කර ගැනීම සඳහා අංක SMEHCI/2/3/3/2 (2021- තනතුරු ඇති කිරීම) හා 2021.12.31 දිනැති ලිපිය කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත. | අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව මත පදනම්ව අතිරික්තයක් ඇති නොවන පරිදි අමාත්‍යාංශයේ බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කර රජයේ අරමුදල් කාර්යක්ෂම අයුරින් භාවිතා කල යුතු වේ. |